# 18 පරිසරය සුරැකීම



18.1 රූපය - පරිසරය

රතු ඉන්දියානු ජාතික සියැටල් මෙසේ කියයි: "ගංගා අපගේ සොහොයුරන් ය. ඒවා අපගේ පිපාසය සංසිඳුවයි. අපගේ ඔරු තැනින් තැන ගෙන යයි. අපගේත් දරුවන්ගේත් කුසගිනි නිවයි. පොළොව අපේ ම කොටසකි. අප පොළොවේ ම කොටසකි. සුවඳ වහනය වන පුෂ්ප අපගේ සොහොයුරියන් ය. වනයෙහි දුව පැන නටන මුවන්, අශ්වයින් හා රාජාලියන් අප සොහොයුරන් ය. කඳු මුදුන් හා තණ පිට්ටනිවල ඇති සාරය එකින් එකට සම්බන්ධ එක ම පවුලේ දේවල් ය."

එම රතු ඉන්දියානු ජාතිකයා අගය කරන පරිසරය දෙවියන් වහන්සේ අපට දී ඇති උතුම් තිළිණයකි. මන්ද යත් දෙවියන් වහන්සේ මැවිල්ලේ නිර්මාතෘවරයාණන් වන සේක. පොළොව, ජලය, කඳු, අහස, සතුන්, පක්ෂීන්, ගස් කොළන්, එළවළු, පළතුරු, තණබිම් යනාදි සියලු දේව මැවිලි මිනිසා සඳහා ය. දේව මැවිල්ල සම්පූර්ණ ය; මනහර ය. මිනිසා විසින් මැවිල්ල ආරක්ෂා කර සුරැකිය යුතු ය. ඒ පිළිබඳ ශුද්ධ ලියවිල්ල සාක්ෂි දරයි.

## මැවීම පිළිබඳ පළමු කතාව අනුව පරිසරය සුරැකීමේ වැදගත්කම

හිස් ව පාළු ව පැවති පොළොව පූර්ණ වූයේත් අලංකාර වූයේත් මනහර වූයේත් දෙවියන් වහන්සේගේ මැවීමේ කාර්යයෙහි ප්‍රතිඵලයක් ලෙසිනි. අනතුරු ව "දරු සම්පත් ලබා, වැඩි වර්ධනය වී, පොළොව පුරා පැතිර එය යටත් කරගන්න" යනුවෙන් පවසමින් දෙවියන් වහන්සේ එම මනහර පොළොව හෙවත් දේව මැවිල්ල මිනිසාගේ භාරකාරත්වයට පත් කළ සේක (උත්පත්ති 1:28). මිනිසාගේ රැකවරණයට ලක් වූ දේව මැවිල්ල මනුෂ්‍ය වාසයට යෝග්‍යය වන්නේ එය සංරක්ෂණය කරමින් පරිභෝජනය කළහොත් පමණි. ධරණීය

සංවර්ධනය යනුවෙන් හඳුන්වන්නේ මෙය යි. ධරණීය සංවර්ධනය ඇති තැන දේව මැවිල්ලේ මනහර බව ආරක්ෂා වේ.

තව ද මිනිසා මවා ඇත්තේ දේව "ස්වරූපය" හා "සමානකම" අනුව ය (උත්පත්ති 1:26). ලෝකාරම්භයේ දී දෙවියන් වහන්සේ විශ්වය මැවූ සේක. එසේ නම් දේව ස්වරූපය හා සමානකම දරන මිනිසා ද දෙවියන් වහන්සේ මැවූ ලෝකය යළි යළි මැවිය යුතු ය. එනම්, එය සංවර්ධනය කළ යුතු ය. එනම්, දේව මැවිල්ල පරිභෝජනය කරන විට එය සුරකිමින් සංවර්ධනය කළහොත් පමණක් මිනිසාට මැවීමේ කාර්යයට දයක විය හැකි ය.

දෙවියන් වහන්සේගේ අභිප්‍රාය වූයේ, මිනිසා විසින් දේව මැවිල්ල "පාලනය" කිරීම ය (උත්පත්ති 1:26). මෙහි "පාලනය" කිරීම සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ "රාදා" ය. එහි අර්ථය වන්නේ, "සංරක්ෂණය" කිරීම ය. සිංහල ව්‍යවහාරය තුළ "සත්ත්ව පාලනය" යන්නෙන් ද එය අදහස් වේ. එනම්, සතුන් පෝෂණය කරමින්, වැඩි වර්ධනය කරමින්, ඔවුන්ගේ ආරක්ෂාව සහතික කරමින් ඔවුන්ට ප්‍රතිකාර කරමින් රැකබලා ගත යුතු වේ. එවිට තම පැවැත්ම ද සහතික වේ.

### මැවීම පිළිබඳ දෙවන කතාව අනුව පරිසරය සුරැකීමේ වැදගත්කම

ලොව මවා වදාළ දෙවි පියාණන් වහන්සේ, මිනිසා මවා මුළු මැවිල්ලේ ම වගකීම ඔහුට පවරන ලද ආකාරය උත්පත්ති පොත දක්වා ඇත:

> ඒදන් උයන වගා කර එය රැක බලා ගැනීම පිණිස දෙවි සමිඳාණන් වහන්සේ මිනිසා රැගෙන ඔහු එහි පදිංචි කරවූ සේක.
>
> (උත්පත්ති 2:15)

මැවීම පිළිබඳ දෙවන කථාවෙන් දෙවියන් වහන්සේ මිනිසාට වගකීම් 2ක් පවරන සේක:

1. **වගා කිරීම:** "වගා කිරීම" සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ, "අබාද්" ය. එහි අර්ථය වන්නේ, "වැඩ කරමින් නිර්මාණය කිරීම" ය. වැඩ කරමින් නිර්මාණය කරන්නා දේව මැවිල්ල සංරක්ෂණය කරයි.
2. **රැක බලා ගැනීම:** "රැක බලා ගැනීම" සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ, "ෂාමාර්" ය. එහි අර්ථය වන්නේ, "සංරක්ෂණය කිරීම" ය. එයින් ද මිනිසා දේව මැවිල්ල සංරක්ෂණය කළ යුතු බව පැහැදිලි ය.

මෙම කාර්ය දෙක මිනිසා සාර්ථක ව කරන්නේ නම් ඔහුට ජීවත් විය හැකි පරිසරයක් මෙලොව පවතිනු ඇත. එයින් තමාගේ යහපත හා සුබ සිද්ධිය සැලසෙනු ඇත.

එම නිසා මැවිල්ල ආරක්ෂා නොකිරීමෙන් බොහෝ ප්‍රතිවිපාක ඇති විය හැකි ය. අද බොහෝ විනාශවලට හේතුව මෙම සැලැස්මට පිටුපා කටයුතු කිරීම යි. ගංවතුර, නියඟ, නායයාම් යනාදිය ඉන් කිහිපයකි. එම නිසා  මැවිල්ල අයුතු ලෙස පරිහරණය නොකළ යුතු ය.

පරිසරය සුරැකීමේ හා වර්ධනය කිරීමේ යුතුකම ඔබ සතු වේ. ඒ සඳහා පහත කාර්යයන්හි නිරත වන්න.

- සොබා දහමට ආදරය කිරීම හා ගරු කිරීම
- පොළොවේ සශ්‍රීකත්වය ආරක්ෂා කිරීම
- අප ජීවත් වන පරිසරය ලස්සන කිරීම
- පරිසරයේ සමතුලිතතාව ආරක්ෂා කිරීම
- පරිසර දූෂණය කිරීමෙන් මිදී එය වැළැක්වීමට දායක වීම
- සරල දිවි පෙවෙතකට හුරු වීම
- අනාගත පරපුර වෙනුවෙන් සම්පත් ඉතිරි කිරීම
- පරිසරය විනාශ කරන අයට එහි ප්‍රතිවිපාක පෙන්වා දීම
- භෞතික සම්පත් වැඩි වර්ධනය කොට ආත්මාර්ථයෙන් තොර ව බෙදා හදා ගැනීම
- තමන් සතු සම්පත් බෙදා ගැනීමට අන් අය දිරි ගැන්වීම.

**ක්‍රියාකාරකම**

1. පහත සඳහන් හෙබ්‍රෙව් වචනවල අර්ථ ලියන්න.
   අ) රාදා　　　ආ) අබාද්　　　ඇ) ෂාමාර්
2. එම එක් එක් වචනය හා පරිසරය සංරක්ෂණය කිරීම අතර ඇති සබඳතාව වෙන වෙන ම කෙටියෙන් විස්තර කරන්න.
3. වර්තමාන සමාජය තුළ පරිසරය සුරැකීමේ හා වර්ධනය කිරීමේ කිතුනු වගකීම පණ ගැන්වීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් **පහක්** පැහැදිලි කරන්න.
4. "අප පරිසරයේ කොටසක් ය. පරිසරය අප ජීවිතයේ කොටසක් ය" යන මාතෘකාව යටතේ මිනිසා දෙවිඳුන්ගේ සහාය මැවුම්කරුවන් වශයෙන්, සමාජීය, ජෛව හා භෞතික පරිසරය වර්ධනය කිරීමට ඔබට කළ හැකි දේ වචන 100කින් පමණ පැහැදිලි කරන්න.



**ජීවිතයට බිඳක්**

***මැවිල්ලට හා පරිසරයට ගරු කරමින් දෙවි පියාණන් වහන්සේට ආදරය කරන්න.***